# III. මහ බැංකු ගිණුම් හා ගනුදෙනු

1963 වසරේ මහ බැංකුවේ මුදල් පිළිබඳ ගිණුම් II වැනි පරිශිෂ්ටයේ 6 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ. 1962 වසර හා සැසැඳීමේ දී දක්නට ලැබුන ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

| | වෙනස | |
|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම් .. .. .. | +135·7 | +12·4 |
| සංසරණයෙහි ඇති මුදල් .. .. .. | +111·4 | +14·1 |
| ඉල්ලුම් තැන්පතු .. .. .. .. | + 24·3 | + 8·1 |
| (වෙළෙඳ බැංකුවල) .. .. .. | + 1·8 | + 1·7 |
| ජාත්‍යන්තර සංචිතය .. .. .. .. | − 37·9 | −24·9 |
| දේශීය වත්කම් .. .. .. .. | +184·4 | +17·1 |
| රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් .. .. | +139·5 | +15·8 |

\+ වැඩිවීම

— අඩුවීම

රන්පවුම් ඩොලර් අනුපාතිකයේ වෙනස්වීම් වලට අනුරූපව ඇමරිකානු ඩොලරයක මහ බැංකු අනුපාතිකය ද (I වැනි පරිශිෂ්ටයේ 'ආ'හි දක්වා ඇති පරිදි) විටින් විට වෙනස් වෙයි.

රන් පවුම් සහ ඉන්දීය රුපියල සඳහා මහ බැංකු අනුපාතිකයෙහි වෙනසෙක් අවුරුද්ද තුළ දී ඇති නොවිණි. එකී අනුපාතිකයන් පහත දැක්වේ.

| | | විදුලි පුවත් මගින් මිලට ගැනීම | විදුලි පුවත් මගින් විකිණීම |
|---|---|---|---|
| රන්පවුම් .. | එතැන් .. | සි. 1 පැ. 63/64 .. | සි. 1 පැ. 61/32 |
| (ලංකා රුපියලකට) .. | ඉදිරි .. (සමස තෙක්) | එතැන් සඳහා මසක වට්ටම පැ. 1/128 .. | එතැන් සඳහා මසක අධිමිල පැ. 1/182 |
| ඉන්දියානු රුපියල් .. | එතැන් .. | රුපියල් 99 3/4 .. | රුපියල් 99 13/16 |
| (සියයට) .. | ඉදිරි .. (සමස තෙක්) | එතැන් සඳහා මසක වට්ටම රු. 1/32 .. | එතැන් සඳහා මසක අධිමිල රු. 1/32 |

මහ බැංකුවේ විදේශීය විනිමය ගනුදෙනු II වැනි පරිශිෂ්ටයේ II වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

ඇතැම් නියමිත ගනුදෙනු නිසා උද්ගත වන රජයේ සුරැකුම් පත් හා භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 4 ගණනේ නොවෙනස්ව පැවතිණි. එසේ ම, මෙරට වගාකරන කෘෂිකාර්මික නිෂ්පාදන මිලට ගැනීම, විකිණීම, හා ගබඩා කිරීම නිසා උද්ගතවන සමූපකාර සමාගම්වල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය ද වර්ෂයකට සියයට 3 ගණනේ නොවෙනස්ව පැවතිණි. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවෙන් කරන වට්ටම් අනුපාතිකය, පිළිගත් අඩුම ටෙන්ඩර් අනුපාතික සාමාන්‍යයෙන් සියයට ⅛ කට තවදුරටත් නියම කැරිණි.

**ව්‍යවහාර මුදල් නිකුතුව**

1963 දී රු. 5 සහ රු. 2 වටිනාකම ඇති අළුත් මෝස්තරයේ නෝට්ටු දෙකක් නිකුත් කරන ලදි. රු. 5 නෝට්ටුව සැප්තැම්බර් මාසයේ දී ද, රු. 2 නෝට්ටුව ඔක්තෝබර් මාසය තුළ දී ද නිකුත් කැරිණි.

රු. 5 නෝට්ටුවෙහි ඉදිරිපස ප්‍රධාන වශයෙන් රතු සහ දුඹුරු පාටින් වන අතර, එය නෝට්ටුවේ මැද සිට යට වාටිය තෙක් පැතිරී ගිය සංකීර්ණ විවිධ පාටින් යුත් මෝස්තරයක් මත මුද්‍රණය කොට ඇත. දිවංගත අගමැති ගරු, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පිළිරුව නෝට්ටුවෙහි දකුණු පැත්තේ පනේලයේ වන අතර, වම් පැත්තේ පනේලයෙහි සිංහ ලාංඡන දිය ලකුණ වෙයි. දකුණු පස කෙළින් අතට ලෝහමය නූලක් ඇතුළු කොට තිබේ. නෝට්ටුවේ පිටුපස මැද පනේලයෙහි මහා පරාක්‍රමබාහු ප්‍රතිමාවේ අනුරූපය රතු පාටින් මුද්‍රණය කොට ඇත. දෙ පැත්තේ පනේල ඒ ඒ ප්‍රමාණයෙන් යුතු කුඩා අකුරු වලින් පිරී ඇත.

රු. 2 නෝට්ටුවෙහි ඉදිරිපස ප්‍රධාන වශයෙන් දුඹුරු පාටින් වන අතර, එය නෝට්ටුවේ මැද සිට යට වාටිය තෙක් පැතිර ගිය සංකීර්ණ විවිධ පාටින් යුත් මෝස්තරයක් මත මුද්‍රණය කොට ඇත. දිවංගත අගමැති ගරු, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පිළිරුව නෝට්ටුවේ දකුණු පැත්තේ පනේලයේ වන අතර, වම් පැත්තේ පනේලයෙහි සිංහ ලාංඡන දිය ලකුණ වෙයි. දකුණු පස කෙළින් අතට ලෝහමය නූලක් ඇතුළු කොට තිබේ. නෝට්ටුවෙහි පිටුපස ද ප්‍රධාන වශයෙන් දුඹුරු පාටින් වන අතර, එහි මැදිරිගිරියේ වටදගෙහි අනුරූපය වෙයි. දකුණු පස පනේලය ඒ ඒ ප්‍රමාණයෙන් යුතු කුඩා අකුරු වලින් පිරී ඇත. මෙම අකුරු නෝට්ටුවේ උඩ කෙළවර දිගේ විහිද ගොස් ඇත.

1963 දී සියලුම වටිනාකම් වල අළුත් මෝස්තරයේ කාසි ද නිකුත් කරන ලදි. සත 50, සත 25 සහ සත 01 යන වටිනාකම් වල අළුත් කාසි කලින් තුබූ මෝස්තරයේ එම වටිනාකම් වල කාසි වලට වඩා කුඩා වන අතර, සත 10, සත 05 සහ සත 02 අළුත් කාසි කලින් තිබූ එකී කාසි වල ප්‍රමාණයෙන් ම වෙයි. අළුත් කාසි වල එක් පැත්තක ලංකාවේ සංනාහ සලකුණ යොද ඇති අතර, අනෙක් පැත්තේ සිංහල සිතුවම් මෝස්තරයක් වන ලියවැලෙන් සකසා ගත් රටා අතර, කාසියේ මැද වටිනාකම ඉලක්කමෙන් ද, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අකුරු වලින් ද යොද ඇත. අළුත් සත 50 සහ සත 25 කාසි තඹ නිකල් වලින්, සාදන ලද අතර, අළුත් සත 02 සහ සත 01 කාසි ඇළුමිනියම් මිශ්‍රණයකින් සාදන ලද්දේ ය. අළුත් සත 10 සහ සත 05 කාසි ද මෙම වටිනාකම් වලින් කලින් තුබූ මෝස්තරයේ කාසි මෙන් ම නිකල් පිත්තල මිශ්‍රනයෙන් ම, සාදන ලද්දේ ය.

අළුත් මෝස්තරයේ නෝට්ටු හා කාසි, කලින් නිකුත් කළ නෝට්ටු හා කාසි සමග භාවිතාව ට වැටෙයි.

**ආදයම හා වියදම**

මේ වසරේ මහ බැංකු ආදයම රුපියල් 3,19,52,225.18 ක් විය. වසරේ මහ බැංකු වියදම මුදල් නීති පනතේ 38 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුව සංචිත සඳහා වෙන් කැරුන, රුපියල් 1,04,41,108.96 ඇතුළුව, රුපියල් 1,99,52,225.18 ක් වී ඇත. ශුද්ධ ලාභය වූ රුපියල් කෝටි 1.2 මුදල් නීති පනතේ 39 (ආ) වගන්තියේ විධිවිධාන අනුව අතිරික්තයට බැර කැරිණි. එසේ කැරුනේ 1963 දෙසැම්බර් අවසානය වන විට මහ බැංකුවේ ප්‍රාග්ධන ගිණුමේ එකතුව මහ බැංකුවේ මුළු වත්කම් වල හා විදේශීය මුදල් වලින් ඇති මහ බැංකු වත්කම් වල වෙනසින් සියයට 15 කට අඩු වූ නිසාය. දනට ඇති අතිරික්තය රුපියල් කෝටි 5.2 කි.

**බැංකු පරිපාලනය**

1963 වසරේදී බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව වෙළෙඳ බැංකු පහක් පරික්ෂා කර බලනලදී.

1957 අංක 42 දරන බැංකු හර බද්ද ක්‍රියාත්මක කිරීමෙහි කාර්යයන් සහ 1961 අංක 65 දරන මුදල් නීති පනතේ, බැංකු ගිණුම් ඇරඹීම හා සම්බන්ධිත, III වැනි කොටස ක්‍රියාත්මක කිරීමේ කටයුතු තවදුරටත් දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබීය.